කාර්ය සාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report

2019

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

தேசிய வரவு செலவுத்திட்டத்திணைக்களம்
நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு

Department of National Budget
Ministry of Finance, Economy and Policy Development

2019 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ජාතික අයවැය දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය . 240

පටුන

1 ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 4
1.1 හැඳින්වීම 4
1.1.1ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 4
1.2 ප්‍රධාන කාර්යයන් 4
1.2.1 ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීම 4
1.2.2 පවත්නා වර්ෂයේ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම 5
1.2.3 අත්තිකාරම් ගිණුම් කටයුතු 6
1.2.4 අයවැය යෝජනාවලට අදාළ අයවැය ප්‍රතිපාදන නැවත මාරු කිරීම 6
2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම 8
2.1 2019 වර්ෂය සඳහා වන විසර්ජන පනත සහ 2019 අතුරු සම්මත ගිණුම 8
2.2 අයවැය සංශෝධන 2019 9
2.2.1 පරිපූරක ඇස්තමේන්තු 9
2.3 අයවැයෙහි කාර්ය සාධනය 11
2.4 අත්තිකාරම් ගිණුම් කටයුතු 16
2.5 රාජ්‍ය වියදම් කළමනාකරණය 17
3 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය 20
3.1මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 20
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 22
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 23
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 25
3.4.1 වාර්තා කිරීමේ පදනම 25
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය- අදාළ නොවේ 26
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය............ 26
3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය............ 27
3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව 27
4 කාර්ය සාධන දර්ශක 28
4.1 වියදම් කළමනාකරණය කිරීම සඳහා නිකුත් කරන ලද චක්‍රලේඛ 28
5 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 29

6 මානව සම්පත් පැතිකඩ 30
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 30
6.2 මානව සම්පත් හිඟය සහ කාර්ය සාධනය 30
6.3 මානව සම්පත් සංවර්ධනය 30
7 අනුකූලතා වාර්තාව 38
8 ඇමුණුම 01 45

1 ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

පාර්ලිමේන්තු පනත්හි ප්‍රතිපාදන යටතේ පිහිටුවන ලද නෛතික රාමුවක් තුළ සහ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ මගපෙන්වීම යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. සමස්ත මධ්‍යකාලීන සාර්ව ආර්ථික රාමුවට අනුකූලව ආංශික මධ්‍ය කාලීන වියදම් රාමුවක් (MTEF) මත පදනම්ව අයවැය සකස් කිරීමේ කේන්ද්‍රීය ස්ථානය ලෙස දෙපාර්තමේන්තුව කටයුතු කරයි. රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රජයේ ව්‍යවස්ථාපිත ආයතන සහ අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමග නිරන්තර තොරතුරු විමසීම්හි මෙම ක්‍රියාවලිය නිරත වේ.

1.1.1ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

රාජ්‍ය සම්පත් කාර්යක්ෂම ලෙස ප්‍රතිපාදනය හා කළමනාකරණය තුළින් සමාජ - ආර්ථික සංවර්ධනය.

මෙහෙවර

රජයේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගනිමින් රාජ්‍ය භාණ්ඩ සහ තෝරාගත් සේවාවන් ඵලදායී ලෙස බෙදා හැරීම සඳහා රාජ්‍ය මූල්‍ය සම්පත් ඇස්තමේන්තුගත කිරීම සහ විසර්ජනය කිරීම.

අරමුණු

- මූල්‍ය සම්පත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස ප්‍රතිපාදනය කිරීම තුළින් ජනතාවගේ සමාජ ආර්ථික සංවර්ධනය තහවුරු කිරීම
- මූල්‍ය විනය පවත්වා ගැනීම
- මූල්‍ය ඒකාබද්ධතාවය තහවුරු කිරීම
- රාජ්‍ය ප්‍රතිපත්ති හා මූල්‍ය සීමාවන්ට යටත්ව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වෙනත් රාජ්‍ය ආයතන සහ ව්‍යවස්ථාපිත ආයතන සඳහා වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම.

1.2 ප්‍රධාන කාර්යයන්

1.2.1 ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීම

ඉදිරි වර්ෂය සඳහා ජාතික අයවැය සකස් කිරීමට පහත සඳහන් කාර්යයන් සිදු කරනු ලැබේ.

- අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමග සාකච්ඡා කර මධ්‍ය කාලීන අයවැය රාමුව (MTBF) නිම කිරීම සහ ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම
- අයවැය කැඳවීම නිකුත් කිරීම

- වියදම් ඒකක හා සාකච්ඡා කර කෙටුම්පත් ඇස්තමේන්තු සැකසීම
- වියදම් ඒකක සමග අයවැය සාකච්ඡා/ උපදෙස් රැස්වීම් මෙහෙයවීම
- අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමග සාකච්ඡා කර ආදායම, වියදම, මූල්‍යකරණ හා ණය ගැනීම් සීමාවන් (දේශීය හා විදේශීය) නිගමනය කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතු නිම කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ හා නීති කෙටුම්පත් සම්පාදකගේ අනුමැතිය ලබා ගැනීම
- විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම
- විසර්ජන පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පලකිරීම
- විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම (පළමුවර කියවීම)
- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත දෙවනවර කියවීමේ විවාදයට සහභාගීවීම
- අයවැය තෙවනවර කියවීමට සහභාගීවීම - කාරක සභා අවස්ථාවේ විවාදය
- අනුමත අයවැය ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- විසර්ජන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාවේ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- වොරන්ට් බලපත්‍ර සකස් කිරීම සහ මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම
- වියදම් දැරීම සඳහා බලය ලබාදීමේ චක්‍රලේඛය නිකුත් කිරීම

1.2.2 පවත්නා වර්ෂයේ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම

ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් කටයුතු සිදුකරනු ලැබේ.

- වියදම් සඳහා බලය ලබාදීම ඇතුළු අයවැය ක්‍රියාත්මක කිරීමට හා අධීක්ෂණය කිරීමට අදාළ උපදෙස් හා චක්‍රලේඛ නිකුත් කිරීම
- අනුමත අරමුදල් සීමාවන් තුළ විශේෂිත අරමුණු වෙනුවෙන්ම එම මුදල් ඵලදායීව යොදා ගැනෙන බව සහ මූල්‍ය විනය පවත්වාගෙන යනු ලබන බව තහවුරු කිරීම සඳහා ක්‍රමවේද හඳුන්වා දීම.
- ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය තහවුරු කිරීම පිණිස වියදම් කිරීමේ ආයතන සමග අන්‍යෝන්‍යව කටයුතු කිරීම.
- ව්‍යවස්ථාපිත මණ්ඩල වෙනුවෙන් මුදල් නිදහස් කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට නිර්දේශ කිරීම.
- විශේෂයෙන්ම මූල්‍ය සම්පත් වෙන්කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව මුදල් අමාත්‍යවරයාගේ නිරීක්ෂණ කෙටුම්පත් කිරීම.
- විසර්ජන පනතේ 6 වගන්තිය යටතේ ප්‍රතිපාදන ප්‍රතිවිසර්ජනය
- වාර්ෂික ඇස්තමේන්තු සුදුසු ලෙස ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා මු.රෙ.66 සහ මු.රෙ.69 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම සඳහා අනුමැතිය ලබාදීම.
- විදේශීය මූල්‍යකරණය යටතේ අරමුදල් සපයන ව්‍යාපෘති සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව වැනි විදේශීය මූල්‍යකරණ ආයතන මගින් පහසුකම් සැලසීම

- රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (COPA), රාජ්‍ය මුදල් කාරක සභාවේ (COPF) හා රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ (COPE) රැස්වීම්වලදී භාණ්ඩාගාරය නියෝජනය කිරීම.
- පාර්ලිමේන්තු කාරක සභා වලදී ජනාධිපතිවරයාගේ රැස්වීම් වලදී සහ අගමැතිවරයාගේ රැස්වීම් වලදී භාණ්ඩාගාරය නියෝජනය කිරීම.

1.2.3 අත්තිකාරම් ගිණුම් කටයුතු

- වාණිජ, ගබඩා සහ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සඳහා සීමා නිර්ණය කිරීම
- අවශ්‍ය අවස්ථාවලදී අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීමට අදාළ පියවර ගැනීම

1.2.4 අයවැය යෝජනාවලට අදාළ අයවැය ප්‍රතිපාදන නැවත මාරු කිරීම

- විසර්ජන පනත පාර්ලිමේන්තුවේ සම්මත වීමෙන් පසුව අයවැය යෝජනාවලට අදාළ අයවැය ප්‍රතිපාදන නැවත මාරු කිරීම



සංවිධාන සැලැස්ම

ජාතික අයවැය දෙපාර්තමේන්තුව

2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

අතුරු සම්මත ගිණුම් දෙකක්, විසර්ජන පනතක් සහ පරිපූරක ඇස්තමේන්තු 32ක් සම්බන්ධව කටයුතු සිදුකිරීමට තිබූ බැවින් 2019 වර්ෂය ජාතික අයවැය දෙපාර්තමේන්තුවට කාර්යබහුල කාලසටහනක් සහිත අභියෝගාත්මක වර්ෂයක් විය.

වසරේ පළමු මාස හතර සඳහා පමණක් අදාළ වන අතුරු සම්මත ගිණුමක් පාර්ලිමේන්තුව මගින් සම්මත කරනු ලැබීමත් සමග 2019 වර්ෂය ආරම්භ වූ අතර, එබැවින් පෙර වර්ෂයේ වෙනුවට එම වර්ෂයේ ආරම්භයේදීම 2019 සඳහා වන අයවැය සකස්කර පාර්ලිමේන්තුව මගින් අනුමත කිරීම නිසා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සැළකිය යුතු තරම් විශාල කාර්යභාරයක් ඉටුකිරීමට සිදුවූයේ පාර්ලිමේන්තු ඉතිහාසයේ සුවිශේෂී වු සිදුවීම්ද සමගිනි. වර්ෂය තුළදී අමාත්‍යාංශ කිහිපයකම විෂය පථයන් වෙනස් වීමද ඒ වන විට පැවති කාර්යබහුල තත්වය තවත් වැඩි වීමට හේතු විය.

ජනාධිපතිවරණය වර්ෂය අවසානයේදී පැවැත්වීමට දින නියම වීම හේතුවෙන් 2020 වර්ෂය සඳහා වන අයවැය ඉදිරිපත් කිරීම කල් දැමුනු අතර එයට විකල්පයක් වශයෙන් නැවත වරක් අතුරු සම්මත ගිණුමක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

2.1 2019 වර්ෂය සඳහා වන විසර්ජන පනත සහ 2019 අතුරු සම්මත ගිණුම

සම්ප්‍රදායක් වශයෙන් යම් වර්ෂයක් සඳහා වන විසර්ජන පනත පාර්ලිමේන්තුව මගින් පෙර වර්ෂයේ අවසානයේදී සම්මතකළ යුතුය. 2018 ඔක්තෝබර් මස අවසානයේදී පාර්ලිමේන්තුව හදිසියේ වාර අවසාන කිරීම හේතුකොට ගෙන, 2019 වර්ෂය සඳහා වන ඇස්තමේන්තුගත වියදම් ඇතුළත්ව 2018 සැප්තැම්බර් මස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද විසර්ජන පනත් කෙටුම්පතේ කටයුතු ඉදිරියට කරගෙන යාමට නොහැකි විය. මෙයට විකල්පයක් ලෙස, විසර්ජන පනතක් පාර්ලිමේන්තුව මගින් සම්මත කරනු ලබන තෙක් බාධාවකින් තොරව රජයේ කාර්යයන් අඛණ්ඩව පවත්වා ගැනීමට හැකිවනු පිණිස, ඒකාබද්ධ අරමුදලින් මුදල් ලබාගැනීමට බලය ලබාගැනීම සඳහා එවකට මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරන ලදී. 2019 වර්ෂයේ පළමු මාස හතර සඳහා වන වියදම් ඇස්තමේන්තු අන්තර්ගත වූ 2019 අතුරු සම්මත ගිණුම 2018 දෙසැම්බර් 21 දින පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලදී.

පසුව, අතුරු සම්මත ගිණුමේ අයවැය ප්‍රතිපාදන ඒකාබද්ධ කරමින්, 2019 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත 2019 පෙබරවාරි 05 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එයට සිදුකරන ලද සංශෝධන සහිතව මෙම පනත් කෙටුම්පත, 2019 අංක 06 දරන විසර්ජන පනත ලෙස බලාත්මක විය.

2.2 අයවැය සංශෝධන 2019

පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවේ සම්මත කිරීමෙන් හෝ මුදල් අමාත්‍යවරයා විසින් විශේෂ නීති සේවා බලපත්‍ර නිකුත් කිරීම මගින් පාර්ලිමේන්තුව මගින් සම්මත කරනු ලබන අයවැය සාමාන්‍යයෙන් සංශෝධනය වේ.

2.2.1 පරිපූරක ඇස්තමේන්තු

පසුගිය දශක දෙක තුළදී පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද පරිපූරක ඇස්තමේන්තු විශාලම සංඛ්‍යාව 2019 වර්ෂයේදී වාර්තා විය. අදාළ කාලසීමාව තුළදී පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද පරිපූරක ඇස්තමේන්තු සංඛ්‍යාව 32 කි.

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සහ මහනගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ වන වැය ශීර්ෂ 31 ක්, 2019 මාර්තු 29 වන දින පාර්ලිමේන්තුවේදී පරාජය වීමෙන් පසුව, එසේ පරාජය වූ වැය ශීර්ෂයන් සඳහා අයවැය ප්‍රතිපාදන ලබාගැනීම සඳහා, රු.බිලියන 287.9 ක පරිපූරක ඇස්තමේන්තු 31 ක් විසර්ජන පනත පාර්ලිමේන්තුව මගින් සම්මත කළ වහාම 2019 අප්‍රේල් 05 වන දින රජය විසින් ඉදිරිපත් කරන ලදී.

පෙර වර්ෂ දෙකෙහි ප්‍රවණතාවයන් අනුගමනය කරමින්, විදේශ ආධාර ලබන ව්‍යාපෘතීන්හි බිල්පත් නිරවුල් කිරීම, සේවයේ යෙදවීමේ අත්තිකාරම් ගෙවීම සහ දේශීය ණය මුදල්වල ණය වාරික ආපසු ගෙවීම සඳහා මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය මගින් රු.බිලියන 65 ක පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. මෙම පරිපූරක ඇස්තමේන්තුව 2019 ජුනි 20 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කරන ලදී.

2.2.2 විශේෂ නීති සේවා බලපත්‍ර

විසර්ජන පනතේ 2 වන උපලේඛනයේ විශේෂ නීති සේවා ලෙස හඳුන්වා දී ඇති රජයේ වියදම් දැරීමට හැකිවනු පිණිස ඒකාබද්ධ අරමුදලින් මුදල් ලබාගැනීමට බලය ලබාදෙමින් විශේෂ නීති සේවා බලපත්‍ර නිකුත් කිරීමට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මුදල් අමාත්‍යවරයාට බලය ලබා දී ඇත. 2.2.2 වගුවේ සඳහන් කර ඇති කාර්යයන් සඳහා වන අතිරේක අරමුදල් අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස 2019 වර්ෂයේදී මුදල් අමාත්‍යවරයා විසින් රු.බිලියන 23.2 ක් වටිනා එවැනි විශේෂ නීති සේවා බලපත්‍ර හයක් (6) නිකුත් කර ඇත.

2.2.2 වගුව **පරිපූරක ප්‍රතිපාදන ලෙස විශේෂ නීති සේවා බලපත්‍ර**

අංකය	වැය ශීර්ෂ අංකය	ආයතනය	කාර්යය/අරමුණ	මුදල (රු.)
01	22	පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ කාර්යාලය	පාර්ලිමේන්තු යෝජනාවක් මගින් අනුමත කරන ලද පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා ගේ වැඩි කරන ලද වැටුප් හා දීමනා ගෙවීම සඳහා	1,320,000
02	10	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ වැඩි කරන ලද වැටුප් හා දීමනා ගෙවීම සඳහා	1,240,000
03	253	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	රජයේ නිලධාරීන්ගේ වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන ඌනතාවය සපුරාලීම සඳහා	2,500,000,000
04	249	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	ණය සේවාකරණය වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන ඌනතාවය සපුරාලීම සඳහා	20,530,000,000
05	239	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව	ආසියානු යටිතල පහසුකම් බැංකු චක්‍රලේඛ 7/2016 අනුව 2015 සිට 2019 දක්වා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව සඳහා දායකත්ව ගාස්තු	160,600,000
06	1	අතිගරු ජනාධිපතිතුමා	හිටපු ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සඳහා විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම වෙනුවෙන්	146,250
එකතුව				23 ,193 ,306 ,250

2.3 අයවැයෙහි කාර්ය සාධනය

කාර්යය	ක්‍රියාකාරකම්	සමස්ත ඉලක්කය	කාර්යසාධනය
1. 2019 අයවැය ක්‍රියාත්මක කිරීම හා වියදම් කළමනාකරණය කිරීම. (2019 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත සාමාන්‍යයෙන් සිදුවන පරිදි පෙර වර්ෂයේදී (2018) පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකරන ලද අතර අතුරු සම්මත ගිණුමක් යටතේ 2019 වර්ෂයේ පළමු මාස හතර ක්‍රියාත්මක විය.)	වියදම් කළමනාකරණය පිළිබඳ උපදෙස් ලබා දෙමින් වියදම් සඳහා බලය ලබා දීමේ චක්‍රලේඛ නිකුත් කිරීම.	රාජ්‍ය වියදම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම.	2019 ජනවාරි 1 වන දින සිට 2019 අප්‍රේල් 30 වන දින දක්වා වන කාලයට අදාළ වන වියදම් වෙනුවෙන් බලය දීම සඳහා 2018.12.27 දිනැති අංක 5/2018 දරණ අයවැය චක්‍රලේඛය නිකුත් කරන ලදී.
2. 2019 වර්ෂය සඳහා වන ජාතික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සහ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. (2019 වර්ෂය සඳහා වන විසර්ජන පනතක් සාමාන්‍ය පරිදි වර්ෂය ආරම්භයේදී නොතිබීම හේතුවෙන් අදාළ කාර්යයන් 2019 වර්ෂයේදී සිදුකරන ලදී.)	වියදම් කිරීමේ ආයතන සහ මහා භාණ්ඩාගාර යේ අදාළ දෙපාර්තමේන්තු සමග සාකච්ඡා කර 2019 වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් සකස් කිරීම.	රජයේ ආර්ථික හා සංවර්ධන අරමුණුවල වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම තහවුරු කිරීම.	පෙර වර්ෂයේදී පූර්ව අයවැය සාකච්ඡා පවත්වා තිබූ බැවින් අමාත්‍ය මණ්ඩලයේ නව ව්‍යුහයට අනුරූප වන අයුරින් ඇස්තමේන්තු අවසන් කිරීම පමණක් සිදු කරන ලදී.

කාර්යය	ක්‍රියාකාරකම්	සමස්ත ඉලක්කය	කාර්යසාධනය
	2019 සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීම.	2019 පෙබරවාරි පළමු සතියේ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. 2019 සවිස්තර ඇස්තමේන්තු සකස් කර මුද්‍රණය කිරීම.	2019 සවිස්තර ඇස්තමේන්තු නියමිත දිනට මුද්‍රණය කිරීම. 2019 සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත 2019.02.05 දින ගැසට් පත්‍රයේ පළ කිරීම. විසර්ජන පනත් කෙටුම්පත 2019.02.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
		විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කිරීම.	2019.04.05 දින අයවැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම (දෙවන වර කියවීම). 2019.04.05 දින පාර්ලිමේන්තුව මගින් විසර්ජන පනත් කෙටුම්පත සම්මත කිරීම. 2019 අංක 06 දරණ විසර්ජන පනත එදිනම ගරු කථානායකතුමා විසින් සහතික කිරීම.
	ගරු මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම.	වියදම් සඳහා බලය දීම.	ගරු මුදල් අමාත්‍යවරයා විසින් 2019.04.06 දින වොරන්ට් බලපත්‍ර නිකුත් කරන ලදී.
3. 2019 අංක 06 දරණ විසර්ජන පනත ක්‍රියාත්මක කිරීම සහ වියදම් කළමනාකරණය.	විසර්ජන පනතේ 5(1) වගන්තිය සහ මුරෙ 66 සහ මුරෙ 69 යටතේ අරමුදල් මාරු කිරීම සඳහා බලය ලබා දීම.	අනුමත ඇස්තමේන්තු තුළ වියදම් කළමනාකරණය කර ගැනීම.	එකී රෙගුලාසි අනුව ඉල්ලීම් 379 ක් වෙනුවෙන් බලය ලබා දී ඇත. එයින් ඉල්ලීම් 51ක් වැඩසටහන් අතර මාරු කිරීම් සඳහා වන අතර 328 ක් ව්‍යාපෘති අතර මාරු කිරීම් සඳහා වේ. මාරු කිරීම් සඳහා වන ඉල්ලීම් 77කට මුරෙ 69 යටතේ බලය ලබා දෙන ලදී.
	6 වන වගන්තිය යටතේ ප්‍රතිපාදන නැවත විසර්ජනය කිරීම.	වියදම් කිරීමේ ආයතන වල මනා ක්‍රියාකාරීත්වය පිණිස ඒවායේ අතිරේක ප්‍රතිපාදන අවශ්‍යතාවන් ලබා දීම.	අනපේක්ෂිත සහ හදිසි ස්වභාවයේ වියදම් (උදා: ගංවතුර, නියගය, පාස්කු ඉරිදා ප්‍රහාරය ආදිය) සහ වියදම් ඇස්තමේන්තුවල පැවති යම් යම් අපගමනයන් සපුරාලීම පිණිස වර්ෂය තුළදී පරිපූරක ප්‍රතිපාදන සඳහා වූ ලිපි 736ක් වෙනුවෙන් රු. බිලියන 159.77ක ප්‍රතිපාදන ලබා දෙන ලදී.

කාර්යය	ක්‍රියාකාරකම්	සමස්ත ඉලක්කය	කාර්යසාධනය
	පරිපූරක ප්‍රතිපාදන ලබා දීම පිළිබඳව පරිපූරක ඇස්තමේන්තු මාස දෙකකට වරක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.	විසර්ජන පනතේ ප්‍රතිපාදන අනුගමනය කිරීම.	ලබා දුන් සියලුම පරිපූරක ප්‍රතිපාදන ආවරණය කරමින් වාර්තා 08ක් ඉදිරිපත් කරන ලදී
	2019 අංක 06 දරණ විසර්ජන පනත සංශෝධනය කිරීම.	2019 අංක 06 දරණ විසර්ජන පනතේ 2(1)(ආ) වගන්තිය යටතේ දක්වා ඇති ණය ලබා ගැනීමේ සීමාවන් සංශෝධනය කිරීම.	සංශෝධන පනත් කෙටුම්පත 2019 නොවැම්බර් 29 දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. කෙසේවුවද පාර්ලිමේන්තුව වාර අවසාන කිරීම හේතුවෙන් එය බලාත්මක නොවීය.
4 2020 සඳහා ජාතික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම.	අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා අයවැය මාර්ගෝපදේශ නිකුත් කිරීම. (අයවැය කැඳවීම)	සියළුම වියදම් කිරීමේ ආයතන මගින් මාර්ගෝපදේශ අනුගමනය කරමින් වාර්ෂික අයවැය සකස් කිරීම.	2019 වර්ෂයේ අවසානයේදී ජනාධිපතිවරණය පැවැත්වීමට නියමිතව තිබූ බැවින් 2019.08.13 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය වූයේ පෙර සිදුවීම් සළකා බලා 2020 සඳහා වන වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම ආරම්භ කිරීම කල් දැමීමටයි. එබැවින් නියමිත පරිදි අයවැය කැඳවීමක් නිකුත් නොකරන ලද අතර අයවැය දින දර්ශනයේ ඉතිරි කාර්යයන් අත්හිටුවන ලදී.
	භාණ්ඩාගාරයේ අදාළ දෙපාර්තමේන්තු හා වියදම් කිරීමේ ආයතන සමග සාකච්ඡා කර වාර්ෂික අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් සැකසීම.	රජයේ ආර්ථික හා සංවර්ධන අරමුණුවල වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම තහවුරු කිරීම.	
	අදාළ අමාත්‍යාංශ සමග අයවැය සාකච්ඡා පැවැත්වීම.	සැබෑ අවශ්‍යතා හඳුනාගෙන යථාර්තවාදී අයවැයක් සැකසීම.	
	2020 සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීම.	විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. 2020 සවිස්තර ඇස්තමේන්තු සකස් කර මුද්‍රණය කිරීම. විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කිරීම.	
	ගරු මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම.	වියදම් සඳහා බලය ලබා දීම.	

කාර්යය	ක්‍රියාකාරකම්	සමස්ත ඉලක්කය	කාර්යසාධනය
5. 2020 වර්ෂයේ පළමු මාස හතර සඳහා වන අතුරු සම්මත ගිණුම සකස් කිරීම.	2020 වර්ෂයේ පළමු මාස හතර සඳහා වියදම් කිරීමේ ආයතන වෙනුවෙන් වන අයවැය ඇස්තමේන්තු සකස් කිරීම.	විසර්ජන පනතක් නොතිබීම හේතුවෙන් රජයේ කාර්යයන් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා වන ප්‍රතිපාදන ලබා දීම	රේඛීය ආයතන සමග සාකච්ඡා කර අතුරු සම්මත ගිණුම සකස් කරන ලද අතර එය 2019.09.30 දින අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී .එයට 2019.10.01 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය.
	අතුරු සම්මත ගිණුම පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිම.		2019.10.23 දින අතුරු සම්මත ගිණුම පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද අතර එය එදිනම අනුමත කරන ලදී.
	ගරු මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍ර නිකුත් කිම.	වියදම් සඳහා බලය දීම.	2019.10.31 දින ගරු මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍ර නිකුත් කරන ලදී.
	වියදම් කළමනාකරණය පිළිබඳව උපදෙස් ලබා දෙමින් බලය ලබා දීමේ චක්‍රලේඛ නිකුත් කිරීම.	වියදම් සඳහා බලය දීම.	ජනාධිපතිවරණයෙන් පසුව අමාත්‍යධූර වෙනස් වූ බැවින් අතුරු සම්මත ගිණුම මගින් අනුමත කරන ලද අයවැය ප්‍රතිපාදන නැවත මාරු කරමින් අංක 09/2019 දරණ අයවැය චක්‍රලේඛය 2019.12.31 දින නිකුත් කරන ලද අතර අතුරු සම්මත ගිණුම යටතේ වියදම් සඳහා බලය ලබා දෙන ලදී.
6. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කළමනාකරණය.	වාර්තා ඉදිරිපත් කිරීම.	නියමිත කාලයට පෙර වාර්තා ඉදිරිපත් කිරීම (අ) මුදල් ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ වියදම් සමාලෝචනය (ආ) දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව (ඇ) විසර්ජන ගිණුම (ඈ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සැසඳීම	පහත වාර්තා නියමිත දිනට ඉදිරිපත් කරන ලදී (අ) වියදම් සමාලෝචනය- 2019 (ආ) කාර්යසාධන වාර්තාව (ඇ) විසර්ජන ගිණුම 2019 (ඈ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම සැසඳීම 2019
	හැකියා වර්ධනය.	දේශීය හා විදේශීය පුහුණු මගින් මානව සම්පත් සංවර්ධනය.	නිලධාරීන් 16 දෙනෙකුට විදේශීය පුහුණුව ලබා දී ඇති අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට අදාළ වැඩසටහන් පිළිබඳව සෑම නිලධාරියෙකුටම දේශීය පුහුණුව ලබා දී ඇත.

කාර්යය	ක්‍රියාකාරකම්	සමස්ත ඉලක්කය	කාර්යසාධනය
	දෙපාර්තමේන්තු අත්තිකාරම් ගිණුම පාලනය කිරීම	අත්තිකාරම් ගිණුමේ සීමාවන්ට අනුකූලව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සෑම අයදුම්කරුවකුටම ණය/ අත්තිකාරම් ප්‍රදානය කිරීම.	බලය ලබා දී ඇති සීමාවන් පිළිපදිමින් රු.6,318,290.00 ක් වටිනා ආපදා ණය පාපැදි ණය විශේෂ අත්තිකාරම් සහ උත්සව අත්තිතකාරම් ලබා දී ඇත.
	විගණන විමසුම් වලට ප්‍රතිචාර දැක්වීම	විගණන විමසුම් අවම කිරීම. පාර්ලිමේන්තුවේ රාජ්‍ය මූල්‍ය පිළිබඳ ආංශික කාරක සභාව, ගිණුම් කාරක සභාව, රාජ්‍ය ව්‍යාපාර කාරක සභාව සහ රාජ්‍ය මුදල් කාරක සභාව නියෝජනය කිරීම	විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් එවන ලද සියලුම විගණන විමසුම් නවයකට (09) පිළිතුරු ලබා දෙන ලදී.
7. විදේශීය සංවර්ධන පාර්ශවකරුවන්ට (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව ආදී) පහසුකම් සැලසීම	අවශ්‍ය අවස්ථා වලදී සංවර්ධන පාර්ශවකරුවන් සමග සාකච්ඡාවලට සහභාගී වීම	සංවර්ධන පාර්ශවකරුවන්ට අවශ්‍ය තොරතුරු ලබා දීම	සංවර්ධන පාර්ශවකරුවන් සමග වඩා යහපත් සහසම්බන්ධයක් පවත්වා ගැනීම

2.4 අත්තිකාරම් ගිණුම් කටයුතු

අත්තිකාරම් ගිණුම් කටයුතු වලට අදාළ සත්‍ය වියදම රු.බිලියන 26.1 ක් වූ අතර ඇස්තමේන්තුගත උපරිම වියදම රු.බිලියන 27.3 ක් විය. රු.බිලියන 21.4 ක් වූ ඇස්තමේන්තුගත අවම ලැබීම් ප්‍රමාණය හා සැසඳීමේදී සත්‍ය මුළු ලැබීම් ප්‍රමාණය රු.බිලියන 24.4 ක් විය. ඒ අනුව, 2019 අංක 06 දරණ විසර්ජන පනතේ අනුමත සීමාවන් තුළ අත්තිකාරම් ගිණුම් කටයුතු සිදු කර ඇත. වාණිජමය ස්වභාවයේ කටයුතු සහ දේපළ ණය හැර රජයේ සේවකයින් සඳහා වන අත්තිකාරම්, අත්තිකාරම් ගිණුම යටතේ වන කටයුතු වලට ඇතුළත් වේ.

2019 විසර්ජන පනතේ 8 වන වගන්තිය යටතේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 19ක් සඳහා සීමාවන් සංශෝධනය කිරීම පහත පරිදි වේ.

අනු ක්‍රමික අංකය	අමාත්‍යංශය/දෙපාර් තමේන්තුව	අයිතම අංකය	II තීරයේ උපරිම වියදම් සීමාව (රු)		III තීරයේ උපරිම ලැබීම් සීමාව (රු)		I තීරයේ උපරිම ණය ශේෂ සීමාව (රු)		අංකය
			From	To	From	To	From	To	
1	අග්‍රාමාත්‍ය කාර්යාලය	00201	23,000,000	21,000,000	11,000,000	9,500,000	77,000,000	76,500,000	1
2	මැතිවරණ කොමිශන් සභාව	02001			18,000,000	20,000,000	95,000,000	115,000,000	2
3	ජාතික ප්‍රසම්පාදන කොමිසම	02401	1,200,000	2,100,000			3,000,000	4,000,000	3
4	ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ කැබිනට් නොවන අමාත්‍යවරයා	05101			2,500,000	1,300,000			4
5	විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ කැබිනට් නොවන අමාත්‍යවරයා	05201			22,300,000	20,000,000			5
6	ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් කැබිනට් නොවන අමාත්‍යවරයා	05301			2,500,000	170,000			6
7	කම්කරු හා වෘත්තීය සමිති සබඳතා කැබිනට් නොවන අමාත්‍යවරයා	05401			4,400,000	3,200,000			7
8	ජනමාධ්‍ය කැබිනට් නොවන අමාත්‍යවරයා	05501	1,000,000	3,500,000	200,000	2,500,000	6,000,000	25,000,000	8
9	විශේෂ ප්‍රදේශ සංවර්ධන කැබිනට් නොවන අමාත්‍යවරයා	05601			300,000	120,000			9

අනු ක්‍රමික අංකය	අමාත්‍යංශය/දෙපාර් තමේන්තුව	අයිතම අංකය	II තීරයේ උපරිම වියදම් සීමාව (රු)		III තීරයේ උපරිම ලැබීම් සීමාව (රු)		I තීරයේ උපරිම ණය ශේෂ සීමාව (රු)		අංකය
			From	To	From	To	From	To	
10	රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යවරයා	13001	40,000,000	65,000,000	23,200,000	42,000,000	85,000,000	206,000,000	10
11	රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය හා මහනුවර සංවර්ධන අමාත්‍යවරයා	15801	4,200,000	5,700,000	2,000,000	2,500,000			11
12	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව	20101			21,000,000	20,500,000			12
13	ශ්‍රී ලංකා නාවික හමුදාව	22301			510,000,000	440,000,000			13
14	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	22401			418,000,000	380,000,000			14
15	පොලිස් දෙපාර්තමේන්තුව	22501			1,080,000,000	1,060,000,000			15
16	ණය සහනදායක මණ්ඩල දෙපාර්තමේන්තුව	23101			500,000	449,000			16
17	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම	26501			11,000,000	10,932,000			17
18	වනජීවී දෙපාර්තමේන්තුව	28301			71,000,000	66,000,000			18
19	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව	33101			275,000,000	255,000,000			19

2.5 රාජ්‍ය වියදම් කළමනාකරණය

2.5.1 ප්‍රතිපාදන මාරු කිරීම

පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද මුළු වියදම් සීමාව තුළ උපයෝජනය නොකළ ප්‍රතිපාදන මාරු කිරීමට හෝ නැවත මාරු කිරීමට අංක 66 සහ 69 (මු.රෙ.66 සහ මු.රෙ.69) දරන මුදල් රෙගුලාසි වල සඳහන් වන වීරමොං පටිපාටිය යටතේ විසර්ජන පනතේ 5 වන වගන්තිය මගින් ආයතනයන්ට ඉඩ ලබාදෙයි. රු.මිලියන 62,778 ක වටිනාකමකින් යුත් එවැනි මාරු කිරීම් සඳහා වන ඉල්ලීම් 1,624 ක් සඳහා 2019 වර්ෂය තුළදී ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබා දී ඇත.

2.5 2 "පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම්" ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන නැවත මාරු කිරීම

වියදම් කිරීමේ ආයතනයන්හි පුරෝකථනය කළ නොහැකි හදිසි සහ අනපේක්ෂිත අතිරේක අරමුදල් අවශ්‍යතා සඳහා ප්‍රතිපාදන සලසා දීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් වැය ශීර්ෂ අංක 240 යටතේ 2019 වර්ෂයේදී ද පරිපූරක සහාය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. 2019 වර්ෂයේ අයවැය යෝජනා සඳහා වන රු.බිලියන 96 ද ඇතුළත්ව මෙම ව්‍යාපෘතිය යටතේ ලබාදුන් මුළු අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය රු.බිලියන 176 ක් වූ අතර 2019 මුද්‍රිත අයවැය ඇස්තමේන්තු වල දක්වා ඇති විශේෂිත මාර්ගෝපදේශයන්ට අනුකූලව එම ප්‍රතිපාදන, වර්ෂය තුළදී වියදම් කිරීමේ ආයතන අතර බෙදා හරින ලදී. 2019 අංක 06 දරණ විසර්ජන පනතේ අවශ්‍යතාවයන් සපුරාලමින් මෙම නැවත වෙන් කිරීම් වලට අදාළව වරින්වර නිකුත් කරනු ලබන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

2019 වර්ෂයේදී රජය විසින් දරණ ලද සමස්ත වියදම සහ ණය ආපසු ගෙවීම රු. බිලියන 4,076ක් වූ අතර එය 2018 වර්ෂයේ රු. බිලියන 3,975ක්වූ අගය හා සැසඳීමේදී සියයට 2.5 ක හෝ නාමික වශයෙන් රු. බිලියන 101ක වැඩිවීමකි. කෙසේවුවද, ආදායම් එකතු කිරීමේ ඌනතාවය හේතුවෙන් සංශෝධිත ඇස්තමේන්තුගත වියදම හා සැසඳීමේදී සත්‍ය වියදම රු. බිලියන 652 කින් පහත වැටුණි. ඒ අනුව වර්ෂය තුළදී ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ අනුපාතය සියයට 82ක් දක්වා අඩු වූ අතර 2018 වර්ෂයේදී වාර්තාවූ අනුපාතය සියයට 92ක්ව පැවතිණි. මේ අතර, 2018 වර්ෂයේදී සියයට 75ක් වූ රජයේ මූලධන වියදම් උපයෝජනය 2019 වර්ෂයේදී සියයට 63ක් දක්වා කැපී පෙනෙන අයුරින් අඩු විය. කෙසේවුවද, වඩාත් අභිමතානුසාරී ස්වරූපයක් නොගන්නා පුනරාවර්තන වියදම සියයට 1 කින් පමණක් සුළු වශයෙන් අඩු වූ අතර එම අගය 2018 වර්ෂයේ සියයට 97ක් වූ අගය හා සැසඳීමේදී සියයට 96ක අගයේ පැවතිනි. පුනරාවර්තන වියදම නාමික වශයෙන් රු. බිලියන 2,417ක් විය.

විසර්ජන පනතේ 2 (1) වගන්තිය යටතේ බලය ලබා දී ඇති ප්‍රතිපාදන උපයෝජන අනුපාතය පනතේ පළමු උපලේඛනයෙන් ලැබෙන අතර (විසර්ජන පනතේ පළමු උපලේඛනය හෝ සැපයුම් සේවාවන් පිළිබඳ වියදම) 2018 වර්ෂයේ සියයට 86 සහ 2017 වර්ෂයේ සියයට 87 හා සැසඳීමේදී 2019 වර්ෂයේදී සියයට 85ක් දක්වා තවදුරටත් අඩු විය. රු. බිලියන 2,408ක් වූ මුල් ඇස්තමේන්තුව හා සැසඳීමේදී වියදම රු. බිලියන 2,032ක් විය. පසුගිය වසර කිහිපයේ ප්‍රවණතාවන්ගෙන් වෙනස් වෙමින් විශේෂ නීති යටතේ දරණ ලද වියදම (විසර්ජන පනතේ දෙවන උපලේඛනයේ මූල්‍යකරණ ක්ෂේත- 21) රු. බිලියන 2,232ක් වූ මුල් ඇස්තමේන්තුව හා සැසඳීමේදී රු. බිලියන 192කින් පසුබැස ඇත. වෙළඳපළ පොළී අනුපාතය අපේක්ෂිත පරිදි වැඩි නොවූ බැවින් 2018 වර්ෂය හා සැසඳීමේදී විශේෂ නීති යටතේ වන වියදම රු. බිලියන 2,123 සිට රු. බිලියන 2,040 දක්වා බිලියන 83කින් අඩු වූ අතර රුපියල් ණය සහ සත්‍ය විනිමය අනුපාතය අපේක්ෂිත මට්ටමට වඩා අඩු අගයකට නැවත සැකසිනි. පෙර වර්ෂය හා සැසඳීමේදී වැඩසටහන්හි ඉදිරි දැක්ම තුළ වැඩසටහන 1- මෙහෙයුම් කටයුතු සහ වැඩසටහන 2- සංවර්ධන කටයුතු ඉහළ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. නාමික වශයෙන් පුනරාවර්තන වියදම රු. බිලියන 2,301 ක් විය. වියදම් සාරාංශය පහත පරිදි වේ.

2.5 වගුව : වියදම් කාණ්ඩ අනුව රජයේ වියදම

වියදම් කාණ්ඩය	රුපියල් බිලියන	පුනරාවර්තන වියදමේ ප්‍රතිශතය	සමස්ත වියදමේ ප්‍රතිශතය
පුනරාවර්තන වියදම	2,322	100	57
මධ්‍යම රජයේ පුද්ගල පඩිනඩි	709	31	17
ගමන් වියදම්	17	1	0
සැපයුම්	112	5	3
නඩත්තු වියදම	8	0	0
සේවාවන්	63	3	2
මාරුකිරීම් (පළාත් සභා සහ රාජ්‍ය ආයතන වලට මාරුකිරීමද ඇතුළත්ව)	524	23	13
පොළී ගෙවීම් සහ වට්ටම්	889	38	22
වෙනත් පුනරාවර්තන වියදම්	1	0	0
වියදම් කාණ්ඩය	රුපියල් බිලියන	මූලධන වියදමේ ප්‍රතිශතය	සමස්ත වියදමේ ප්‍රතිශතය
මූලධන වියදම	637	100	16
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	27	4	1
මූලධන වත්කම් අත්පත් කර ගැනීම	114	18	3
මූලධන මාරු කිරීම්	121	19	3
මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම	37	6	1
හැකියා ප්‍රවර්ධනය	6	1	0
වෙනත් මූලධන වයදම	332	52	8
රාජ්‍ය ණය ක්‍රමක්ෂය කිරීම	1,117		27
සමස්ත වියදම	4,076		100

3 වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ- එෆ්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු .

අයවැය 2019		සටහන	තත්‍ය 2019	2018	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	ඒසීඒ-1
-	අන්තර් ජාතික වෙළඳාම මත බදු	**3**	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් සහ වෙනත්	**4**	6,793,535	38,886,714	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		5,997,403,325	6,128,747,675	**ඒසීඒ-3**
-	තැන්පතු		66,788,779	111,684,748	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		10,991,606	9,646,528	**ඒසීඒ-5**
-	වෙනත් ලැබීම්		115,132,025	7,808,724	
-	**මුළු ආදායම් නොවනලැබීම් (ආ)**		**6,190,315,735**	**6,257,887,675**	
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නෙවන ලැබීම් = (අ)+ (ආ)**		**6,197,109,270**	**6,296,774,389**	
	අඩු කළා - වියදම				
-	**පුනරාවර්තන වියදම**		-	-	
-	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	99,484,154	92,674,562	
-	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	605,683,285	1,146,400,753	**ඒසීඒ-2(ii)**

-	සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම්	**7**	33,520,361	52,769,743	
-	පොළී ගෙවීම්	**8**		-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
-	**මුළු පුනරාවර්තන වියදම්**		**738,687,800**	1**,291,845,058**	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණුකිරීම	**10**	629,148	798,284	**ඒසීඒ-2(ii)**
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	**11**	5,324,979,279	4,950,366,459	
-	ප්‍රාග්ධන පැවරීම	**12**	-	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
-	හැකියා වර්ධනය	**14**	3,111,757	1,454,781	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
-	**මුළු මූලධන වියදම් (ඉ)**		**5,328,720,184**	**4,952,619,524**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**127,240,264**	**12,323,713**	
	තැන්පතු ගෙවීම්		116,859,279	511,954	**ඒසීඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		10,380,984	11,811,759	**ඒසීඒ-5**
	මුළු වියදම උ =(ඈ +ඉ +ඊ)		6,194,648,247	6,256,788,295	
-	**2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ =(ඇ -උ)**		**2,461,022**	**39,986,094**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ- පී

2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2019 රු.	2018 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	21,737,380,974	24,907,860,401
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ- 5/5 (අ)	26,471,732	27,082,353
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	635,608	83,325
මුළු වත්කම්		**21,764,488,314**	**24,935,026,080**
ශුද්ධ වත්කම්/ ස්කන්ධය			
ශුද්ධ වත්කම්		(151,062,508)	(200,439,062)
දේපළ, පිරියත හා උපකරණ සංචිතය			
කුලී වැඩ හා අත්තිකාරම් සංචිතය	ඒසීඒ- 5 (ආ)	21,737,380,974	24,907,860,401.09
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	177,534,240	227,604,740.00
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	635,608	
මුළු වගකීම්		**21,764,488,314**	**24,935,026,079.51**

Detail Accounting Statements in ACA format Nos. 1 to 6 presented in pages from 05 to 145 and Notes to accounts presented in pages from 146 to 153 form and integral parts of these Financial Statements. The Financial Statements have been prepared in complying with the Generally Accepted Accounting Principles whereas most appropriate Accounting Policies are used as disclosed in the Notes to the Financial Statements and hereby certify that figures in these Finacial Statements, Notes to accounts and other relevant accounts were reconciled with the Treasury Books of Accounts and found to in agreement.

Chief Accounting Officer Name : S.R.Attygalle Designation : Secretary Ministry of Finance, Economic and Policy Development Date 26.02.2020	Accounting Officer Name : Jude Nilukshan Designation : Director General Department of National Budget Date 24.02.2020	Chief Financial Officer/ Chief Accountant/ Director (Finance)/ Commissioner (Finance) Name : G.D.M. Muditha Gunarathna Department of National Budget Date : 24.02.2020
S. R. Attygalle Secretary to the Treasury and Secretary to the Ministry of Finance, Economy and Policy Development The Secretariat Colombo 01	Jude Nilukshan Director General Department of National Budget General Treasury Colombo 01	G.D.M. Muditha Gunarathna Accountant Department of National Budget General Treasury Colombo 01.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තථ්‍ය 2019 (රු.)	2018 (රු.)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිතවූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	121,925,560	6,136,556,399
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	5,997,403,325	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**6,119,328,885**	**6,136,556,399**
අඩු කළා- මුදල් වැය කිරීම:		

පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	704,971,889	92,674,562
සහනාධාර සහ මාරු කිරීම් වියදම්	33,520,361	1,198,807,526
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම්	1,991,981	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**740,484,231**	**1,291,482,088**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)= (අ) -(ආ)	**5,378,844,654**	**4,845,074,311**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපකරණ ණය අයකර ගැනීම	-	-
අත්තිකාරම් අයකර ගැනීම	9,817,186	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩු කළා- මුදල් වැය කිරීම		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත්කර ගැනීම්	5,328,720,185	4,952,619,524
අත්තිකාරම් ගෙවීම්	9,871,154	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය	**5,338,591,339**	**4,952,619,524**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)= (ඈ) -(ඉ)	**(5,328,774,153)**	**(4,952,619,524)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)= (ඇ) + (ඊ)	**(50,070,500)**	**(107,545,213)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	66,788,779	111,684,748
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**66,788,779**	**111,684,748**
අඩු කළා- මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම	-	3,627,581
විදේශීය ණය ආපසු ගෙවීම	-	-
	-	
තැන්පතු ගෙවීම	116,859,279	511,954
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**116,859,279**	**4,139,535**

මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය_(ඒ)= (උෟ) -(එ)	**(50,070,500)**	**(107,545,213)**
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) - (ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.4.1 වාර්තා කිරීමේ පදනම

1) වාර්තා කිරීමේ කාලය

මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා වාර්තා කිරීමේ කාලය 2019 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වේ.

2) මිනුම් කිරීමේ පදනම

වෙනත් ආකාරයකින් විශේෂිත කොට දක්වා නොමැති නම් මිස, ඇතැම් වත්කම් නැවත ඇගයීම සහ නවීකරණය කරන ලද මූල්‍ය පදනම මත ගණනය කිරීම මගින් නවීකරණය කරන ලද ඓතිහාසික පිරිවැය මත මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

ආසන්නතම රුපියලට ගණනය කරන ලද ශ්‍රී ලංකා රුපියල් මගින් මූල්‍ය ප්‍රකාශයේ සංඛ්‍යා ඉදිරිපත් කර ඇත.

3) ආදායම හඳුනාගැනීම

අදාළ ආදායම් කාල සීමාව නොසළකා ගිණුම්කරණ කාල සීමාව තුළදී මුදල් ලැබීම මත විනිමය හා විනිමය නොවන ආදායම හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මිනුම් කිරීම (PP&E)

වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා යන විට සහ වත්කම් පිරිවැය විශ්වසනීය අයුරින් මැනිය හැකිවිට දේපළ , පිරියත හෝ උපකරණ අයිතමයක් හඳුනාගනී.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැය මගින් මනිනු ලබන අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන විට නැවත ඇගයීමේ ආකෘතිය යොදා ගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිත

මෙම නැවත ඇගයීමේ සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණ ගිණුමේ අනුරූපී ගිණුම වේ.

6) <u>මුදල් සහ මුදල් හා සමාන වෙනත් දේ</u>

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය මුදල් නෝට්ටු සහ කාසි මුදල් සහ මුදල් හා සමාන වෙනත් දේ යන්නට ඇතුළත් වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය- අදාළ නොවේ

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	708,000	742,162	738,687.8	100
ප්‍රාග්ධන	5,307,000	5,330,160	5,328,720.18	100

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	2019.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂය	2019.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තා අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	97,962.31	97,962.31	-	100
9152	යන්ත්‍රෝපකරණ				
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්	21,639,418,664.39	21,639,418,664.39	-	100

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

2019 වර්ෂය තුළදී විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් විමසුම් නවයක් (09) ක් මෙම දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර ඒ සියල්ලටම නිසි පරිදි පිළිතුරු ලබා දී ඇත.

** විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අතර පරිලෝකන ගත කර මෙහි දක්වනු ලැබේ. (ඇමුණුම 1 ලෙස මේ සමග අමුණා ඇත)

4 කාර්ය සාධන දර්ශක

4.1 වියදම් කළමනාකරණය කිරීම සඳහා නිකුත් කරන ලද චක්‍රලේඛ

පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයේ බලපෑම හේතුවෙන්, අපේක්ෂිත ආදායම් ඉලක්ක කැපී පෙනෙන ලෙස පහත වැටුණි. එබැවින්, රාජ්‍ය වියදමේ විචක්ෂණශීලී භාවය සහතික කිරීම පිණිස පහත පරිදි විශේෂිත චක්‍රලේඛ කිහිපයක්ම නිකුත් කරන ලදී. ජාතික අයවැය චක්‍රලේඛ මගින් හඳුන්වා දෙන ලද දැඩි වියදම් පාලන ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයක් ලෙස නව ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම වැනි ප්‍රමුඛ නොවන වියදම් වලින් කැපී පෙනෙන ප්‍රමාණයක් වර්ෂය තුළදී අඩුකර ගත හැකි විය.

රාජ්‍ය වියදම් කළමනාකරණයට අදාළව නිකුත් කරන ලද චක්‍රලේඛ

චක්‍රලේඛ අංකය	දිනය	විෂයය
NB/9/2019	2019.12.31	අතුරු සම්මත ගිණුම 2020
NB/8/2019	2019.12.18	2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම
NB/7/2019	2019.12.04	රාජ්‍ය වියදම් කළමනාකරණය හා මූල්‍ය විනය පවත්වා ගැනීම
NB/6/2019	2019.09.28	ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) මගින් මු.රෙ. (FR) මාරු කිරීම පිළිබඳ අනුමත කාර්ය පටිපාටිය හා අතිරේක අයවැය ඉල්ලීම
NB/5/2019	2019.09.14	2019 වර්ෂයේ ඉතිරි කාලසීමාව තුළ රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම
NB/4/2019	2019.06.17	2019 රාජ්‍ය වියදම් දැරීමේ විචක්ෂණශීලී භාවය වර්ධනය කිරීම
NB/3/2019	2019.04.08	2019 අයවැය-වියදම් දැරීම සඳහා බලය දීම
NB/2/2019	2019.04.08	ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම් වූ අයවැයකරණයට අදාළව දත්ත සහ තොරතුරු රැස් කිරීම සහ සෑම අමාත්‍යාංශයකම "ස්ත්‍රී පුරුෂ සමාජ භාවය මත පදනම්වූ කේන්ද්‍රීය ඒකක " පිහිටුවීම
NB/1/2019	2019.01.25	2018 විසර්ජන ගිණුම් ඇතුළු වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සැකසීම

5 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වනුයේ රාජ්‍ය ආයතන මගින් රටෙහි පුරවැසියන් සඳහා භාණ්ඩ හා සේවා ලබා දීම පිණිස රජයේ මූල්‍ය සම්පත් ඇස්තමේන්තුගත කිරීම හා විසර්ජනය කිරීම වන බැවින් ඉලක්ක 17ක්, අරමුණු 164ක් හා දර්ශක 244ක් සහිත 2030 සඳහා වන තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඍජුවම අදාළ නොවේ. කෙසේවුවද, අනෙක් ආයතන වලට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගත නොහැකි බැවින් සියලුම ඉලක්ක දෙපාර්තමේන්තුවට අදාළ වන බව හඳුනාගෙන ඇත. ඒ අනුව, ජාතික අයවැය මගින් එම ආයතන වෙත අරමුදල් ලබාදීම පෙළගස්වමින් තිරසර සංවර්ධන ඉලක්ක, අයවැයකරණ ක්‍රියාවලිය සමග ප්‍රධාන ප්‍රවාහ ගතකිරීමට දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන ඇත.

යම් වර්ෂයක් සඳහා වන විසර්ජන පනත පෙර වර්ෂය අවසානයේදී පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන නමුදු 2019 ඔක්තෝම්බර් මස අවසානයේදී පාර්ලිමේන්තුව හදිසියේ විසිරුවා හැරීම නිසා 2018 සැප්තැම්බර් මස ඉදිරිපත් කරන ලද 2019 වර්ෂය සඳහා වන විසර්ජන පනත ඉදිරියට ක්‍රියාත්මක කළ නොහැකි විය. එබැවින්, 2019 පළමු මාස හතර සඳහා වන වියදම් ඇස්තමේන්තු අන්තර්ගත වූ අතුරු සම්මත ගිණුමක් සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා ලදී. එමනිසා රජයේ සේවාවන් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා වන වියදම් පමණක් ඇතුළත් කරන ලද බැවින් තිරසර සංවර්ධන ඉලක්ක අතුරු සම්මත ගිණුම සමග ප්‍රධාන ප්‍රවාහගත කිරීමට දෙපාර්තමේන්තුවට නොහැකි විය.

කෙසේවුවද, තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට අදාළව දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබාදීමට දෙපාර්තමේන්තුවට හැකිවූ අතර, 2019 අප්‍රේල් 05 වන දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2019 අයවැය ඇස්තමේන්තුවල එම ව්‍යාපෘතීන්හි තොරතුරු ඇතුළත් කරන ලදී. ඒ ඒ අමාත්‍යාංශවල තිරසර සංවර්ධන අරමුණු වලට අදාළ ප්‍රධාන ව්‍යාපෘතීන් 2019 අයවැය ඇස්තමේන්තුවල දක්වා ඇත.

අයවැයෙහි දැනට පවතින සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය හේතු කොට ගෙන තිරසර සංවර්ධන ඉලක්ක වලට අදාළ නව ව්‍යාපෘතීන් සීමිත සංඛ්‍යාවක් 2019 අයවැයෙහි ඇතුළත් කරන ලදී. තිරසර සංවර්ධන ඉලක්ක වලට අදාළ ප්‍රධාන ව්‍යාපෘතීන්හි අපේක්ෂිත ඉලක්ක හා ප්‍රධාන කාර්ය සාධන දර්ශක දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබුණද එම දර්ශක සාක්ෂාත් කර ගැනීම හඳුනාගැනීමේ හා ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමේ නිසි යාන්ත්‍රණයක් නොමැති අතර රාජ්‍ය ප්‍රතිපත්තීන්හි නිරන්තර වෙනස්වීම් නිසා සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය අවුල්සහගත තත්වයකට පත්වීම සහ තිරසර සංවර්ධන ඉලක්ක අයවැය සමග ප්‍රධාන ප්‍රවාහගත කිරීම ප්‍රමාද වීමද සිදුවිය හැක.

6 මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	38	30	08
තෘතීයික	04	04	0
ද්විතීයික	68	61	07
ප්‍රාථමික	38	35	03

6.2 මානව සම්පත් හිඟය සහ කාර්ය සාධනය

කාර්ය මණ්ඩලයේ හිඟය නිසා රාජකාරී කටයුතු ඉටු කිරීමේදී දෙපාර්තමේන්තුවට දුෂ්කරතාවන් වලට මුහුණ දීමට සිදුවේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
ආසියානු පැසිපික් නායකයින්ගේ මැලේරියා සන්ධානය ජ්‍යෙෂ්ඨ නිලධාරී හමුව	02	දින 02	84,756.46	-	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
දකුණුආසියානු විශ්ව විද්‍යාලයේ II අදියරේ මූල්‍ය ප්‍රවීණයින්ගේ කමිටුවේ දෙවන රැස්වීම	01	දින 01	42,288.88	-	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ /ලෝක බැංකුවේ වාර්ෂික රැස්වීම	01	දින 05	1,914,412.74	-	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
ශ්‍රී ලංකා සැලසුම් සේවයේ 1 පන්තියේ නිලධාරීන් සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහන	02	සති 01	104,424.08	-	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
කොට්ඨාස අධ්‍යක්ෂ මට්ටමින් පාලන හැකියා ප්‍රවර්ධනය පිළිබඳව සංවර්ධනය වන රටවල් සඳහාවන සමුළුව-2019	**01**	**සති** 03	**166,415.24**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
ආසියානු ඇගයීම් සතිය- 2019	**01**	**දින** 05	**44,146.46**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
ශ්‍රී ලංකා මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව් අධ්‍යයන චාරිකාව	**01**	**දින** 04	**36,125.98**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
ස්ත්‍රී පුරුෂ සමාජාවය සඳහා ප්‍රතිචාර දැක්වීමේ අයවැයකරණය පිළිබඳ රටවල් හරහා වන අධ්‍යයන වැඩමුළුව	**01**	**දින** 02	**58,655.66**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
ස්ත්‍රී පුරුෂ සමාජාවය සඳහා ප්‍රතිචාර දැක්වීමේ අයවැයකරණය පිළිබඳ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩමුළුව	**02**	**දින** 03	**61,932.19**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
3වන ආසියානු මුදල් සංසදයඃ සියල්ල ඇතුළත් මූල්‍යකරණයේ අනාගතය	**01**	**දින** 05	**44,593.30**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
සයිබර් ආරක්ෂක අධ්‍යයන චාරිකාව	**01**	**සති** 01	**53,898.01**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
මූල්‍ය වැඩසටහන්කරණය හා ප්‍රතිපත්ති පිළිබඳ වැඩසටහන	**01**	**දින** 12	**4,179.35**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
ආසියාවේ යටිතල පහසුකම් සංවර්ධනය, මූල්‍යකරණය හා පාලනය පිළිබඳ	**01**	**දින** 02	**72,890.35**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
සම පදස්ථ අධ්‍යයන සමුළුව						
කාර්යයන්හි අනාගතය පිළිබඳ සම්මන්ත්‍රණයඃ ආසියානු ඵලදායිතා සංවිධානය මගින් සංවිධානය කරන ලද සමුළුව	**01**	**දින** 03	**46,704.40**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
සියල්ල ඇතුළත් හා තිරසර සංවර්ධනය සඳහාවන මූල්‍යකරණය පිළිබඳ ආසියානු පැසිපික් සම්මන්ත්‍රණය	**01**	**දින** 03	**374,338.23**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
සංවර්ධනය වන රටවල් සඳහා වන ස්වෛරී මූල්‍යකරණය	**01**	**සති** 08	**68,010.25**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
ජීවී නගර සංසදය සඳහාවන නාගරික ප්‍රවාහනය	**01**	**දින** 05	**52,212.04**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
ශ්‍රී ලංකාව සඳහා වන යටිතල පහසුකම් සැලසුම්කරණය හා ඉදිකිරීම් පිළිබඳ සමුළුව- 2019	**01**	**සති** 03	**170,092.40**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව	**01**	**වර්ෂ** 02	**-**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
මූල්‍ය අභියෝග තක්සේරු කිරීම හා කළමනාකරණය කිරීම	**01**	**දින** 05	**46,008.02**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
මූල්‍ය අංශයේ ප්‍රතිපත්තීන්	**01**	**දින** 05	**47,179.51**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
සෞඛ්‍ය සම්පන්න ආහාර හා භෞතික ක්‍රියාකාරකම්	**01**	**දින** 05	**67,780.01**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
පිළිබඳ වැඩමුළුව: ප්‍රතිපත්ති සැලසුම්කරණයෙ හා ක්‍රියාත්මක කිරීමේ නෛතික ගැටළු						වැදගත් වේ.
ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ සමුළුව	**01**	**දින** 26	**198,956.80**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
ප්‍රජාපාදක ක්ෂුද්‍ර ණය හා ප්‍රමාණාත්මක ආර්ථික සංවර්ධනය	**01**	**සති** 02	**101,468.41**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
චීනයේ පැවති සංවර්ධනය වන රටවල් සඳහාවන රාජ්‍ය පාලන ක්‍රම හා පාලන හැකියාවන් නවීකරණය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය-2019	**01**	**සති** 03	**181,842.52**	**-**	විදේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව	**03**	**වර්ෂ**01	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්	**01**	**දින** 03	**18,000.00**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
පුද්ගලික ලිපිගොනු කළමනාකරණය	**01**	**දින** 02	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
පොදු පහසුකම් සංගණනය, හානිවීම් හා බැහැර කිරීමේ මණ්ඩල පිළිබඳ වැඩමුළුව	**01**	**දින** 02	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
ලිපිගොනු කළමනාකරණය හා සාමාන්‍ය කාර්යාල පරිපාලනය, ආයතන සංග්‍රහය	**08**	**දින** 03	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
යෙදවුම්-නිමැවුම් ආර්ථික විශ්ලේෂණය පිළිබඳ වැඩමුළුව-උපායමාර්ගික දැනුම් විසඳුම් ලබාදීමට සහායවීම- 1 කොටස- මූලිකාංග	**04**	**දින** 01	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
වෘත්තීය ඉංග්‍රීසි පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව	**01**	**දින** 01	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
ශ්‍රී ලාංකික උපායමාර්ග වැඩසටහන් ඇගයීම පිළිබඳ වැඩමුළුව	**02**	**දින** 01	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, රෙගුලාසි හා සැලසුම්කරණය	**01**	**දින** 03	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ සහතික පත්‍රය	**03**	**මාස 06**	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
රාජ්‍ය මූල්‍ය විශ්ලේෂණය හා අනාවැකි පැවසීම පිළිබඳ පාඨමාලාව	**05**	**දින 05**	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
ප්‍රසම්පාදන කමිටුවල හා තාක්ෂණික කමිටුවල භාණ්ඩාගාර නියෝජිතයින්ගේ රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම	**02**	**සති 01**	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
කළමනාකරණ සහකාරවරුන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	**02**	**දින 02**	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
රජයේ වැටුප් ලේඛන ක්‍රමය	**02**	**දින 03**	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
ලංසු ඇගයීම පිළිබඳ වැඩමුළුව	**29**	**දින 05**	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
මුදල් රෙගුලාසි හා කාර්යාල පනත පිළිබඳ පුහුණු වැඩසටහන	**39**	දින 04	**65,984.00**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහය	**03**	දින 02	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
පරිපූර්ණ සමාජ සංවර්ධනය සඳහා ප්‍රතිඵල මත දැනුම් කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	**02**	දින 04	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
වැඩිදියුණු කළ ආර්ථික තක්සේරුව සඳහා සාර්ව ආර්ථික ආදර්ශය	**04**	දින 06	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
හැකියා ප්‍රවර්ධන වැඩසටහන	**81**	දින 02	**1,052,420.00**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
රජයේ නිලධාරීන් සඳහා MSEXCEL පිළිබඳ උසස් නිපුණතාව	**01**	දින 02	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
ශ්‍රී ලංකාවේ ළමා දරිද්‍රතාවය හා අඩුපාඩු	**01**	දින 02	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
තිරසර සංවර්ධන	**02**	දින 01	**-**	**-**	දේශීය	කාර්යාලයීය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
ඉලක්ක						කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
දෙමළ භාෂා පාඨමාලාව	**01**	**දින** 16	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
රජයේ වැටුප් ලේඛන ක්‍රමය	**01**	**දින** 03	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය	**03**	**දින** 02	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
රියදුරන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම වැඩිදියුණු කිරීම	**17**	**දින** 02	**140,000.00**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
රජයේ නිලධාරීන් සඳහා MSEXCELපිළිබඳ උසස් නිපුණතාව	**01**	**දින** 02	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
රාජ්‍ය අංශයේ ණය සංඛ්‍යාලේඛන පිළිබඳ පුහුණු වැඩසටහන	**02**	**සති** 04	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.
සාමාන්‍ය ආගන්තුක සත්කාරය පිළිබඳ පුහුණු වැඩසටහන	**17**	**දින** 01	**66,800.00**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
රාජ්‍ය සේවයේ විනය ක්‍රියාපටිපාටිය	**01**	දින 03	**-**	**-**	දේශීය	කාර්යාලයීය කටයුතු වලදී භාවිතා කිරීමට මෙම දැනුම වැදගත් වේ.

7 අනුකූලතා වාර්තාව

අංකය	**අදාළ කර ගත යුතු අවශ්‍යතාව**	**අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)**	**අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම**	**අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග**
1 පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත්කර තිබේ				
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2 පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම				
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත	අනුකූල වේ		

	දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම			
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3 මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)				
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 17/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකල වේ		
4 වාර්ෂික සැලසුම් සකස් කිරීම				
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

5 විගණන විමසුම්				
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබේ	අනුකූල වේ		
6 අභ්‍යන්තර විගණනය				
6.1	මු.රෙ. 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	-		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7 විගණන හා කළමනාකරණ කමිටු				
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුවඅවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8 වත්කම් කළමනාකරණය				
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම	-		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර්	අනුකූල වේ		

	ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්ත නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපති කර තිබීම	-		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	-		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	-		
9 වාහන කළමනාකරණය				
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	-		
10 බැංකු ගිණුම් කළමනාකරණය				
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත 'කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින්			

	අනාවරණය වූ හා ගැලපුම් කළ යුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල 'කර තිබීම	අනුකූල වේ		
11 ප්‍රතිපාදන උපයෝජනය				
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්				
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	-	-
13 පොදු තැන්පත් ගිණුම				
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14 අග්‍රිම ගිණුම				
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු. රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය , භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15 ආදායම් ගිණුම				

15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	-		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	-		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	-		
16 මානව සම්පත් කළමනාකරණය				
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/ 2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත 'කර තිබීම	අනුකූල වේ		
17 මහජනයා වෙත තොරතුරු ලබා දීම				
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙනඅතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18 පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම				
18.1	අංක 05/ 2008 හා 05/ 2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		

18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂනය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19 මානව සම්පත්සැලැස්ම සම්පාදනය කිරීම				
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කර තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේසෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දක්වෙන් ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට අනුකූල වේ		
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20 විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම				
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම ඇමුණුම	අනුකූල වේ		

8 ඇමුණුම 01

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } විඅාර්ථ/පි/එන්බිඩී/2019/එෆ්ඒ/06 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 මැයි 3/ දින

ගණන්දීමේ නිලධාරී
ජාතික අයවැය දෙපාර්තමේන්තුව

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

Scanned with CamScanner

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම

ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
2.1 (ආ)	20.03.04.00 දරන ආදායම් ශීර්ෂය මගින් 2016 වර්ෂයේ සිට මේ දක්වා දළ ආදායම් රැස් කිරීම් රු.221,917,359 ක් හා ආදායමින් ආපසු ගෙවීම් රු.101,048,388 ක් හා ශුද්ධ ආදායම රු.120,868,971 ක් ලෙස වැරදි ගිණුම්ගත කිරීම් නිවැරදි කිරීම පමණක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය. එසේම ඒ තුළ මුදලින් ආපසු ගෙවීම් 2016 වර්ෂයේ රු.19,106,185 ක් හා 2017 වර්ෂයේ රු.8,461,330 ක් විය.	මෙම වර්ෂයේදීද වැරදි ගිණුම්ගත කිරීම් පමණක් සිදු කර ඇත.
2.1 (ඇ)	යතුරුපැදි ව්‍යාපෘතිය අවසන් වී පැවතියද ඉහත ආදායම් ශීර්ෂයට 2016 වර්ෂයේ සිට මේ දක්වාම ආදායම් ලැබීම සිදුවන අතර තවදුරටත් ලැබිය යුතු ශේෂ පවතීද පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර නොතිබුණි. එසේම එම යෝජනාව අවසන් වූයේ නම් අදාල පාර්ශව වෙත උපදෙස් ලබා දී තවදුරටත් පවතින නිවැරදි කිරීම් හා ගිණුම්ගත කිරීම් සිදුකර ශීර්ෂය අවසන් කිරීමට පියවරගෙන නොතිබුණි.	තවදුරටත් පවතින නිවැරදි කිරීම් හා ගිණුම්ගත කිරීම් අවසන් කිරීමට පියවර ගෙන නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

(අ) 2014/2015 වර්ෂයේ අයවැය යෝජනාවලට අනුව 2015 වර්ෂයේ සිට රජයේ නිලධාරීන්ට ලබා දෙන යතුරු පැදි සම්බන්ධ මූලික ගෙවීම් ගිණුම්ගත කිරීම සඳහා සංකේතාංක 20.03.04.00 දරන මෙම ආදායම් ශීර්ෂය ආරම්භ කර තිබුණි. එසේ වුවද, 2016 වර්ෂයේ සිට මේ දක්වා මෙම ශීර්ෂයට ආදායම් ඇස්තමේන්තු සකස් කර නොතිබුණි.

(ආ) එසේම, මෙම ආදායම් ගිණුම මඟින් 2016 වර්ෂයේ සිට මේ දක්වා දළ ආදායම් රැස් කිරීම රු.221,917,359 ක් හා ආදායමින් ආපසු ගෙවීම් රු.101,048,388 ක් හා ශුද්ධ ආදායම රු.120,868,971 ක් ලෙස වැරදි ගිණුම්ගත කිරීම් නිවැරදි කිරීම පමණක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය. එසේම ඒ තුළ මුදලින් ආපසු ගෙවීම් 2016 වර්ෂයේ රු.19,106,185 ක් හා 2017 වර්ෂයේ රු. 8,461,330 ක් විය.

(ඇ) තවද යතුරුපැදි ව්‍යාපෘතිය අවසන් වී පැවතියද මෙම ආදායම් ගිණුමට 2016 වර්ෂයේ සිට මේ දක්වාම ආදායම් ලැබීම සිදුවන අතර තවදුරටත් ලැබිය යුතු ශේෂ පවතීද පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර නොතිබුණි. එසේම එම යෝජනාව අවසන් වූයේ නම් අදාල පාර්ශව වෙත උපදෙස් ලබා දී තවදුරටත් පවතින නිවැරදි කිරීම් හා ගිණුම්ගත කිරීම් සිදුකර ගිණුම අවසන් කිරීමට පියවරගෙන නොතිබුණි.

2.2 වියදම් කළමනාකරණය

2.2.1 වැඩසටහන 01

(අ) වැය විෂයයන් 02 ක එකතුව වූ රු.4,750,000 ක ප්‍රතිපාදන මු.රෙ. 66 - 69 ප්‍රතිපාදන යටතේ සියයට 20 සිට සියයට 440 දක්වා වැඩි කිරීම් ද වැය විෂයයන් 08 ක එකතුව වූ රු.66,600,000 ක ප්‍රතිපාදන සියයට 11 සිට සියයට 27 දක්වා අඩු කිරීම් ද සිදු කර තිබුණි.

(ආ) 2019 වර්ෂයේ 1406 කල්බදු වාහන සඳහ පොලී ගෙවීම් වැය විෂයය යටතේ මූලික ඇස්තමේන්තු ලෙස රු. 525,000,000 ක් හා රු. 51,972,000 පරිපූරක වෙන් කර තිබුණු අතර වර්ෂය අවසාන වන විට ඉන් රු. 1,713,857 ක මුදලක් ඉතිරි වී තිබුණි.

(ඇ) එසේම අංක 2108 - කල්බදු වාහන සඳහා ණය මුදල් ආපසු ගෙවීම් වැය විෂයය යටතේ පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ. 66/69 යටතේ පිළිවෙලින් රු.5,350,000 හා 14,290,000 ක ප්‍රතිපාදනය මාරු කර තිබුණි. ඒ අනුව එම වැය විෂයන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන වෙන් කිරීම් කර ගැනීම, නියමිත වට්නාකම් අනුව ඇස්තමේන්තු කිරීම සිදු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

2.2.2 වැඩසටහන 02

වැඩසටහන 02 මූලධන වියදම් යටතේ, ව්‍යාපෘතිය 03 (අයවැය යෝජනා) සඳහා රු.49,525,000,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 22 ක් ඉතිරිව ඇති බව නිරීක්ෂණය විය.

2.2.2.1 ව්‍යාපෘතිය 02 - පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම්

මූලධන වැය විෂයන් 04 ක රු.34,377,300,000 ක් වූ ප්‍රතිපාදන මූ.රෙ. 66 යටතේ සියයට 15 සිට සියයට 100 දක්වා වැඩි කිරීම්ද, රු.40,129,513,000 ක් වූ පුනරාවර්තන වැය විෂයයක ප්‍රතිපාදන සියයට 13 දක්වා අඩු කිරීම්ද සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය.

2.2.2.2 ව්‍යාපෘති 03 - අයවැය යෝජනා

(අ) පුනරාවර්තන වැය විෂයයන් 02 ක හා මූලධන වැය විෂයයන් 11 ක එනම් අයවැය යෝජනා 13 ක රු.4,075,000,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිය සියයට 100 ක් වන බව නිරීක්ෂණය විය.

(ආ) එසේම පුනරාවර්තන වැය විෂයයන් 03 ක (අයවැය යෝජනා 03 ක) රු.1,500,000,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් සියයට 32 සිට සියයට 63 දක්වා පරාසයක විය.

(ඇ) ප්‍රාග්ධන වැය විෂයයන් 12 ක (අයවැය යෝජනා 12 ක) රු.10,300,000,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් සියයට 20 සිට සියයට 85 දක්වා පරාසයක විය.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 04 ක (අයවැය යෝජනා 04 ක) ප්‍රතිපාදන මූ.රෙ. 66 යටතේ මාරු කිරීම් රු.32,000,000,000 ක් වූ මූලික ඇස්තමේන්තුවෙන් සියයට 10 සිට සියයට 80 දක්වා අඩු කිරීම් සිදු කර ඇති බව නිරීක්ෂණය විය.

(ඉ) වැය විෂය අංක 2509-27 යටතේ මූලික ඇස්තමේන්තුවක් සිදු කර නොතිබුණු අතර 2019 ජූනි 06 දින අංක D002 දරන මූ.රෙ. මාරු කිරීම මගින් රු. 100,000,000 ක් මෙම වැය විෂයට මාරු කර ගෙන තිබුණි.

2.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

2.3.1 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම

(අ) මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 305,621 ක් වූ ණය ශේෂය වසර 18 කට අධික කාල සීමාවක සිට දෙපාර්තමේන්තුවට අයවිය යුතු ශේෂයක් ලෙස පවතින අතර මේ සම්බන්ධව පසුගිය විගණන විමසුම් තුලින් පෙන්වා දී තිබුණ ද, එම ණය ශේෂයන් 2019 දෙසැම්බර් 31 දින වන විටදීත් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) එසේම සේවය හැර ගොස් ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.150,119 ක් වූ ණය ශේෂය අයකර ගැනීම සම්බන්ධව මීට පෙර වර්ෂ කිහිපයකදීද විගණන විමසුම් මගින් පෙන්වා දී තිබුණද, එම ශේෂයන් අයකර ගැනීමට හැකි වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

2.4 තැන්පතු

ගිණුම් අංකය : 6000/0000/00/0013/0129/000

මෙම තැන්පතු ගිණුම තෙවන පාර්ශවයක් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු ගිණුමක් වන අතර 2019 දෙසැම්බර් 31 දිනට රු.177,534,240 ක ශේෂයක් පැවතුණි. තවද, මෙම තැන්පතු ගිණුම තුළ රාජ්‍ය සේවයේ ක්ෂේත්‍ර නිලධාරීන් විසින් මෝටර් බයිසිකල් නිරවුල් කර ගැනීම සඳහා ගෙවූ රු.116,692,440 ක මුදලක් ආදායම් සංකේතාංක 20.03.99.00 දරන අනෙකුත් ලැබීම් ආදායම් ගිණුමට බැර කර තිබුණි. ඒ අනුව රජයේ ආදායමට බැර කරන ලද රු.116,692,440 ක වටිනාකමට හා 2019 දෙසැම්බර් 31 දිනට ගිණුමේ ශේෂය ලෙස පවතින රු. 177,534,240 ක් වූ තැන්පතුවලට අදාළ මෝටර් බයිසිකල් සඳහා කල්බදු වාරික හා පොලී තවදුරටත් ගෙවෙමින් පවතින බව නිරීක්ෂණය විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NAOSL NATIONAL AUDIT OFFICE

3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

එස්.එම්.ඩී.එස්. සුදිජ් රෝහිත
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට